ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන පීඨය

කළමනාකරණ අධ්‍යයන (ගෞරව) උපාධි පාඨමාලාව

OSU4574 – නීතිය සහ ගිවිසුම් නීතිය හඳුනාගැනීම
අවසාන අධ්‍යයන පරීක්ෂණය – 2024 / 2025
කාලය –පැය තුනයි

දිනය: 2025 ජූනි 28 *වේලාව: ප.ව. 01.30 - ප.ව. 04.30*

උපදෙස්:

- මුළු ප්‍රශ්න සංඛ්‍යාව ප්‍රශ්න හය (06) කි.
- පළමු ප්‍රශ්නය (01) අනිවාර්ය වේ.
- ප්‍රශ්න අංක එක (01) සහ වෙනත් ඕනෑම ප්‍රශ්න හතරක් (04) සඳහා පිළිතුරු ලිවිය යුතු ය. ඒ අනුව පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව ප්‍රශ්න පහ (05)කි.
- අපැහැදිලි අක්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1) a. බලතල බෙදීමේ මූලධර්මය (doctrine of separation of powers) පැහැදිලි කරන්න. (ලකුණු 10)

b. ශ්‍රී ලංකාවේ බලතල බෙදීමේ මූලධර්මය කෙතරම් දුරට ක්‍රියාත්මක වන බව ඔබ සිතනවා ද? උදාහරණ සපයන්න. (ලකුණු 10)

2) a. නීති මූලාශ්‍ර (sources of law) යන්නෙහි අදහස පැහැදිලි කරන්න. (ලකුණු 06)

b. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික නීති මූලාශ්‍ර (primary sources of law) තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

c. ශ්‍රී ලංකාවේ පවත්නා වැදගත් නීති මූලාශ්‍රයක් පිළිබඳ ව කෙටි සටහනක් ලියන්න. (ලකුණු 06)

d. ශ්‍රී ලංකාවේ පවත්නා ප්‍රධාන පුද්ගල නීති (personal laws) වර්ග තුන මොනවා ද? එක් එක් පුද්ගල නීතීන්හි කැපී පෙනෙන ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

3) a. ශ්‍රී ලංකාවේ අධිකරණ ධුරාවලිය විස්තර කරන්න. (ලකුණු 05)

b. ශ්‍රී ලංකාවේ ඉහළ ම අධිකරණ කුමක් ද, සහ ඒ තුළ විභාග කෙරෙනුයේ කුමන ආකාරයේ කරුණුද? (ලකුණු 06)

c. විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන් (Alternative Disputes Mechanisms- ADR) වර්ග තුනක් (03) හඳුනා ගන්න. (ලකුණු 03)

d. විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන්හි (ADR) වාසි සහ අවාසි මොනවා ද? (ලකුණු 06)

4) සමන්ති කමල් සමග ගිවිසුමකට එළඹුණු අතර , ඇගේ නිවසේ අයිතිය පැවරීමට එකඟ විය.කෙසේ වෙතත් ,වැඩි වන දේපල මිල ගණන් හේතුවෙන් ඇය ඇගේ ගිවිසුම්ගත බැඳීම් ප්‍රතික්ෂේප කළ අතර නිවස වෙනත් නැනැන්තෙකු හට වැඩි මිලකට විකිණීමට සැළසුම් කළා ය.මෙම සිදුවීම මත පදනම් ව (a) සිට (d) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

a. කමල් ට ලබා ගත හැකි ප්‍රතිකර්ම (remedies) පිළිබඳව ඔහු හට උපදෙස් ලබා දෙන්න. (ලකුණු 05)

b. කමල් යා යුත්තේ කුමන අධිකරණයට ද? (ලකුණු 05)

c. සමන්ති හට ගින්නෙන් විනාශ වීම හේතුකොටගෙන නිවාසයේ භිමිකාරිත්වය පැවරීමට නොහැකි වූයේ නම් ,සමන්ති සහ කමල් අතර ඇති ගිවිසුමික සබඳතාවයට කුමක් සිදු වේද? (ලකුණු 05)

d. කොන්ත්‍රාත්තුවේ විෂය වස්තුව නිවසක් වෙනුවට මෝටර් රථයක් නම් (a)ප්‍රශ්නය සඳහා ඔබේ පිළිතුර වෙනස් වන්නේ ද?ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 05)

5) a. කොන්ත්‍රාත්තුවක් අවසාන (termination) කළ හැකි ක්‍රම හතර මොනවා ද? (ලකුණු 04)

b. එවැනි එක් ක්‍රමයක් පිලිබඳ ව කෙටි සටහනක් ලියන්න. (ලකුණු 06)

c. නයනි, පහන් මානසික රෝගියෙකු බව නොදැන පහන් හා සමග ගිවිසුමකට එළඹේ.මෙය වලංගු ගිවිසුමක් ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 05)

d. වරිතා බාලවයස්කාරයෙකු (minor) වූ අමන්දි සමග සහාය නොලත් ගිවිසුමකට එළඹුණාය.අමන්දිගේ දැන් වයස අවුරුදු 20ක් වන අතර ඇය තවමත් කොන්ත්‍රාත්තුවෙන් බැඳී සිටිනවා ද යන්න දැන ගැනීමට අවශ්‍යය වේ.අදාළ නඩු තීන්දු දක්වමින් අමන්දි හට උපදෙස් දෙන්න. (ලකුණු 05)

6) a. ගිවිසුමක නීත්‍යානුකූල වලංගුභාවය අභියෝගයට ලක් කරන (vitiating elements) මූලිකාංග තුනක් (03) ලියන්න. (ලකුණු 03)

b. ඉලෙක්ට්‍රොනික සමාගමක අලෙවි නියෝජිතයෙකු වන ධම්මි, සියලුම ශීතකරණ ඉහළ වෝල්ටීයතාවයන්ට ඔරොත්තු දෙන පරිදි ඉදි කර ඇති බව පාරිභෝගිකයෙකුට සහතික කරයි.මෙම තොරතුරු මත පදනම් ව පාරිභෝගිකයා ශීතකරණයක් මිල දී ගනියි.නමුත් ඉහළ වෝල්ටීයතාවය හේතුවෙන් එය එක් දිනකින් ක්‍රියා විරහිත වේ.පාරිභෝගිකයාට ධම්මි කළ ප්‍රකාශය සඳහා ඇයට නඩු පැවරිය හැකි ද?අදාළ නඩු තීන්දු දක්වමින් ඔබේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 07)

c. වයස අවුරුදු 75ක් වූ ලිහිණි එදිනම ඉහත ඉලෙක්ට්‍රොනික සමාගමට ගොස් රුපියල් 300,000 කට ශීතකරණයක් ඇණවුම් කළා ය.කෙසේ වෙතත් ,ශීතකරණයේ සැබෑ වටිනාකම රුපියල් 30,000 ක් වූ අතර ,එදින ඇයට ඇගේ ඇස් කණ්ණාඩි අමතක වූ නිසා ඇය එය නොදුටුවා ය. ධම්මි මෙම අංගයෙහි වටිනාකම සම්බන්ධයෙන් වූ වැරදීම දැන සිටිය නමුත් ශීතකරණය රු.300,000 කට විකිණීමට ඇය එකඟ විය.ලිහිණි දැන් ශීතකරණය ආපසු ලබා දිය හැකි ද (Return) යන්න පිළිබඳ ව ඔබේ උපදෙස් පතයි. (ලකුණු 10)

-සියලුම හිමිකම් ඇවිරිණි -